# පාට මොකද්ද ?





නෙතුලි තිලකරත්න

# පාට මොකද්ද ?

කතෘ :- නෙතුලි හිමංසා තිලකරත්න

ISBN අංකය :- 978-624-206-965-4

කෘතිය පල කරන දිනය :- 2023/ 11 / 15

කතෘගේ වෙනත් කෘති :-
කූඹි රැජින
මලීගේ උපකාරය
දඟකාර මීකි
කපුටු බඩගින්න
The Queen Ant

# පිදුම

මගේම

ආ අප්පච්චිටත්,

ද අම්මාටත්,

ර මල්ලීටත්,

ණී සමන්මලී

ය ගුරුමැණියන්ටත්

පුද දෙමි

මෙම පොත

සදාදර සිතින් !

# ස්තූතිය!

උදව්

උපකාර

කළ

සැමට

මාගේ

හදපිරි

**ස්තූතිය !**

නෙතුලි හිමංසා තිලකරත්න

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකිම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකිමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණ කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “ **දිවිය දිනන විද්‍යුත් පොතක්** ” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවිම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “ **දිවිය දිනන විද්‍යුත් පොතක්** ” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

# පාට මොකද්ද ?

''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''''

''''දවසක් නංගියි, මල්ලියි සමනලයෙක් දැකලා.




ඒ දෙන්නා පාට දන්නෙ නැහැනෙ.

නංගි නිල් පාට කියනවා.

මල්ලි රතු පාට කියනවා.

ඇත්තට ම ඒ සමනලයා කහ පාට.

මම පාට දන්න හින්දයි මම කිව්වේ.




එයාලා රණ්ඩුව නතර කරන්නේ ම නෑ.

මම ඒකට හොඳ උපායක් යෙදුවා.

ම් ම් ම් ............


ක්‍රියාකාරකමක් කළොත් හොඳයි.

“සමනලයාගේ ජීවන චක්‍රය”




මම කතුරුමුරුංගා ගහෙන් කොළ ඉත්තක් කඩා ගෙන එයාලට සමනලයාගේ බිත්තර පෙන්නුවා.

ඒවා බෝතලයකට දැම්මා.



ඒවා දාලා දැන් සතියයි.

අපි බලන් ඉන්නකොට දළඹුවෝ බිත්තරයෙන් එළියට ඇවිල්ලා කොළ කන්න පටන් ගත්තා.




දැන් සති දෙකයි.

දළඹුවෝ කෝෂය හදන්න පටන් ගත්තා.



හැබැයි අපි දැක්කා දළඹුවෝ සිවිය ගලවලා උගේ දළඹු ජීවිතයට සමු දුන්න ලස්සන. ඒක වුණේ කෝෂය හදන්න කලින්.




හතරවන සතියත් ආවා.

අනේ! ලස්සන සමනල පැටවු දෙන්නෙක්.



නංගිගේ සමනලයා කහ පාටයි. නංගි එයාට චණ්ඩි කියලා නම් කළා.



මල්ලිගේ සමනලයා සුදු පාටයි. මල්ලි එයාව බණ්ඩි කියලා නම් කළා.



අපි එයාලව නිදහස් කළා.


නංගියි, මල්ලියි සතුටින්

"අපි දැන් පාට දන්නවා" කියලා කෑ ගැහුවා.



එයාලා සමගියෙන් සෙල්ලම් කළා.

මට හරිම සතුටුයි.




නෙතුලි හිමංසා තලකරත්න

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !


මෙයට

**සෙනවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ


2023 . 11 . 01

**ISBN 978-624-206-965-4**